කොමිෂන් සභාවේ සභාපතිවරයා, එසේ පත් කරනු ලබන කමිටුවක සාමාජිකයකු වන අවස්ථාවක ඔහු ඒ කමිටුවේ සභාපතිවරයා විය යුත්තේ ය. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා එසේ පත් කරන කමිටුවක සාමාජිකයකු නොවන අවස්ථාවක ඒ කමිටුවේ සාමාජිකයන් අතුරෙන් ඔහු විසින් ලියවිල්ලකින් නම් කරනු ලබන යම් සාමාජිකයකු ඒ කමිටුවේ සභාපතිවරයා විය යුත්තේ ය.

(3) එවැනි යම් කමිටුවක් පත් කරනු ලැබූ විට, ඒ කමිටුව පත් කිරීම සඳහා වූ විධානයේ නිශ්චය කොට දක්වා ඇති රජයේ නිලධර ගණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු පත් කිරීමේ, මාරුකිරීමේ, සේවයෙන් පහකිරීමේ සහ විනය පාලන බලතල කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කිරීම නතර විය යුත්තේ ය.

(4) ඒ එක් එක් කමිටුවට ලේකම්වරයෙක් වන්නේ ය. ලේකම්වරයා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන්නේ ය.

(5) එවැනි යම් කමිටුවක, කවර වූ හෝ රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය දෙදෙනෙකුගෙන් සමන්විත වන්නේ ය.

(6) එවැනි යම්කිසි කමිටුවක සාමාජික ධුරයක් හිස්ව තිබුණ ද ඒ කමිටුවට ක්‍රියා කිරීමට බලය ඇත්තේ ය. තවද එවැනි සම් පූරප්පාඩුවක් හෝ යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් හෝ තිබූ පමණින් ඒ කමිටුවේ යම් ක්‍රියාවක් නැතහොත් කටයුත්තක් නිර්බල නොවන්නේ ය; නිර්බල වන්නාක් සේ නො සැලකිය යුත්තේ ය.

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කමිටුවක් විසින් හෝ බලය පැවරීම.**

58. (1) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ ඒ කොමිෂන් සභාවේ කමිටුවක් විසින් කවර වූ හෝ ගණයක රජයේ නිලධරයන් පත්කිරීමේ, මාරුකිරීමේ, සේවයෙන් පහකිරීමේ හෝ ඔවුන්ගේ විනය පාලනය කිරීමේ ඒ කොමිෂන් සභාව හෝ කමිටුව හෝ සතු බලතල, අමාත්‍ය මණ්ඩලය විසින් නියම කරනු ලබන යම් කොන්දේසිවලට යටත්ව රජයේ නිලධරයකුට පවරා දෙනු ලැබිය හැක්කේ ය.

(2) මෙයට ඉහතින් වූ අනුව්‍යවස්ථාව යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ ඒ කොමිෂන් සභාවේ කමිටුවක් විසින් හෝ යම් රජයේ නිලධරයකු වෙත බලය පවරා දෙනු ලැබුවේ ද ඒ රජයේ නිලධරයා විසින් කරන ලද මාරුකිරීමේ හෝ සේවයෙන් පහ කිරීමේ නියමයකින් නැතහොත් විනය කටයුත්තක් සම්බන්ධව කරන ලද වෙනත් යම් නියමයකින් අතෘප්ත කවර වූ හෝ රජයේ නිලධරයකුට අවස්ථාවෝචිත පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත හෝ එකී කමිටුව වෙත හෝ අභියාචනය කිරීමට අයිතියක් ඇත්තේ ය.

**පත් කිරීම ආදිය වෙනස් කිරීමට, අහෝසි කිරීමට හෝ අවලංගු කිරීමට අමාත්‍ය මණ්ඩලයට බලය ඇති බව.**

59. (අ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ ඒ කොමිෂන් සභාවේ කමිටුවක් විසින් හෝ අභියාචනයේ දී නැතහොත් අන්‍යාකාරයකින් කරන ලද යම්කිසි පත් කිරීමක්, මාරු කිරීමේ නැතහොත් සේවයෙන් පහ කිරීමේ නියමයක් හෝ විනය කටයුත්තක්